"රාත්‍රී සමාජ ශාලාවේ බීමතින් නැටූ කතුන් 33කට 7500 බැගින් දඩ" යන සිරස්තලය යටතේ පෙබරවාරි 03, 2022 දින අරුණ පුවත්පතේ පළ වූ ලිපියකි.

පුවතෙහි අන්තර්ගතයෙහි දැක්වෙන්නේ කාන්තාවන් පිරිසක් රාත්‍රී සමාජ ශාලාවක සිටියදී නිරෝධායන නීති උල්ලංඝණය කිරීමේ වරදට අත්අඩංගුවට ගෙන දඩ නියම කළ බවයි. මෙම ලිපියෙහි සිරස්තලය සහ අන්තර්ගතය දෙස බලන විට ගැටලුකාරී කාරණා කිහිපයක් නිරීක්ෂණය විය. මෙම කාන්තාවන් මුල්වරට අත්අඩංගුවට ගත් අවස්ථාවේද වෙනත් පුවත්පතක පළ වූ මේ හා සමානම ලිපියක් Ethics Eye අපි මින් ඉහතදීද ප්‍රශ්න කළෙමු.

1) කාන්තාවන් අත්අඩංගුවට ගත්තේ නිරෝධායන නීති කැඩීමේ වරදට නම්, සිරස්තලයේ සඳහන් වන ආකාරයට "ඔවුන් බීමතින් නැටූ" බව පුවතට අදාළ වන්නේ කෙසේද?

2) පුවත් උප සිරස්තලයක් තුළ කැපී පෙනෙන ලෙස දක්වා තිබුණේ "වැඩි පිරිසක් දික්කසාද වූ අය" බවයි. ඔවුන්ගේ විවාහක/අවිවාහක බාවය ද පුවතට අදාළ වන්නේ කෙසේද? එසේ සඳහන් කරන්නේ, එම කාන්තාවන් "දික්කසාද වූ අය" වීම ඔස්සේ, ඔවුන්ගේ වරදට වැඩි බරක් එකතු වන බව පෙන්වීමට ද?

3) එසේ නම් එය ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගනිමින් කාන්තාවන්ව කොන් කිරීමක් ලෙසින් ඔබ නොදකින්නේ ද?

මේ පිළිබඳව ඔබේ අදහස කුමක්ද?

අපගේ පෙර පෝස්ටුවට
සබැඳිය: **https://www.facebook.com/ethicseye/photos/1589880924700292**